# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශේෂ**

**අංක 2454/35 – 2025 සැප්තැම්බර් මස 17 වැනි බදාදා – 2025.09.17**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**


# IV (අ) වැනි කොටස – පළාත් සභා

## පළාත් සභා නිවේදන

### බස්නාහිර පළාත් සභාවේ 1998 අංක 03 දරන සමුපකාර සමිති ප්‍රඥප්තිය යටතේ බලතල පැවරීමේ නියෝගය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(ඇ) ව්‍යවස්ථාව සමග කියවිය යුතු බස්නාහිර පළාත් සභාවේ 1998 අංක 03 දරන සමුපකාර සමිති ප්‍රඥප්තියේ 02(2) වගන්තිය යටතේ බස්නාහිර පළාතේ ආණ්ඩුකාරවර හනීෆ් යුසූෆ් වන මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව බස්නාහිර පළාතේ සමුපකාර සංවර්ධන කොමසාරිස් සහ සමුපකාර සමිති රෙජිස්ට්‍රාර්වරයාට සහයවීම පිණිස පත් කර ඇත්තා වූ පහත උපලේඛනයේ ඇතුළත් එහි I වැනි තීරුවේ නම සඳහන් අනුරූපීව II වැනි තීරුවේ සඳහන් තනතුර දරන්නා වෙත එහි උපලේඛනයෙහි III වැනි තීරුව යටතේ නිශ්චිතව විස්තර වන බලතල 2025.08.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි පවරනු ලබන බව මෙයින් නිවේදනය කරමි.

**හනීෆ් යුසූෆ්,**
ආණ්ඩුකාරවර,
බස්නාහිර පළාත.

2025 ක් වූ සැප්තැම්බර් මස 12 වැනි දින,
බත්තරමුල්ල,
බස්නාහිර පළාත් සභා ගොඩනැගිල්ලේ පිහිටි,
බස්නාහිර පළාත් ආණ්ඩුකාරවර කාර්යාලයේ දී ය.


1A – PG7249 – 07 (2025/09)

*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

I වැනි උපලේඛනය

| *I වැනි තීරුව* | *II වැනි තීරුව* | *III වැනි තීරුව* |
|---|---|---|
| (1) හේවාෆොන්සේකාගේ චින්තක පුබුදු කුසුම් ශ්‍රී ෆොන්සේකා | සමුපකාර සංවර්ධන සහකාර කොමසාරිස් (දෙපාර්තමේන්තුමය) | බස්නාහිර පළාත් සභාවේ 2011 අංක 04 දරන සමුපකාර ප්‍රඥප්තියෙන් සංශෝධිත 1998 අංක 03 දරන සමුපකාර සමිති ප්‍රඥප්තියේ අංක 02(3), 4, (4(2) හැර), 5, 6, 7, 8, 33, 43(අ), 43(ආ), 44, 45, 46, 47, 50, 52, 53, 54, (54(2) හැර), 58(2), 59, 67, 68, 69, 74 හා 76 යන වගන්ති යටතේ රෙජිස්ට්‍රාර්වරයා සතු බලතල සහ 1972 අංක 05 දරන සමුපකාර රීති මාලාවේ 4, 11, 15, 16(II), 19, 22(II), 27, 32, 37, 39, 40, 41, 42, 49, 52 හා 53 යන වගන්ති යටතේ රෙජිස්ට්‍රාර්වරයා සතු බලතල. |

EOG 09 – 0166

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.